මැරුණ අය ගැන අපිට බලාපොරොත්තුවක් (I වෙනි කොටස)

තොරතුරු අරගෙන තියෙන්නේ jw.org/si වෙබ් අඩවියේ තියෙන 'බයිබලයේ සඳහන් ඉගැන්වීම් නිවැරදිව තේරුම්ගනිමු' යන පොතේ 7වෙනි පරිච්ඡේදයෙන්.

ලිපියේ අරමුණ: ඔයා විශ්වාස කරන්නේ මොකක්ද කියලත් එහෙම කරන්නේ ඇයි කියලත් හිතලා බලන්න. බයිබලයේ ඒ ගැන කියන දේ හොයලා බලන්න. ඔයාගේ විශ්වාසයන් අනිත් අයට පැහැදිලි කරන විදිහ ගැනත් හිතලා බලන්න.



මරණය නිසා ඇති වෙන වේදනාව නැති වෙන කාලයක් එයිද?

I ඔයා විශ්වාස කරන දේ ගැන ගැඹුරින් හිතන්න

සමහරු නැහැ කියලා කියන්නේ ඇයි?

සමහරු ඔව් කියලා කියන්නේ ඇයි?

ඔයා විශ්වාස කරන්නේ මොනවද?

ඔයා එහෙම විශ්වාස කරන්නේ ඇයි?


www.jw.org © 2015 Watch Tower Bible and Tract Society of Pennsylvania

2 බයිබලයේ කියන්නේ මොකක්ද කියලා හොයලා බලන්න

අපි ආදරය කරන කෙනෙක් මැරුණාම දුකක් දැනෙන එක සාමාන්‍යයි.
('බයිබලයේ ඉගැන්වීම්' පොතේ 7වෙනි පරිච්ඡේදයේ 1-6 ඡේද බලන්න.)

1 කොරින්ති 15:26 කියවන්න.
දෙවියන් මරණය සතුරෙක් හැටියට සලකනවා නම් කෙනෙක්ගේ මරණයේදී අපි දුක් වෙන එක ගැන ඔහු අපිට දොස් කියයිද? ඔයා එහෙම කියන්නේ ඇයි?

යොහන් 11:33, 35; 14:9 කියවන්න.
අපි ආදරය කරන කෙනෙක් මැරුණාම අපිට දැනෙන වේදනාව ගැන යෙහෝවා දෙවියන්ටයි යේසුස්ටයි හැඟෙන්නේ කොහොමද?



අඳුරු වලාවන් ඈත් වුණාම එළිය වැටෙනවා වගේ අපි ආදරය කරන අය නැවත නැඟිට්ටාම දුක සතුටට පෙරළෙනවා

www.jw.org © 2015 Watch Tower Bible and Tract Society of Pennsylvania

නැවත නැඟිටීම නිසා අපේ දුක සතුටට පෙරළෙනවා.

('බයිබලයේ ඉගැන්වීම්' පොතේ 7වෙනි පරිච්ඡේදයේ 7-10 ඡේද බලන්න.)

ලූක් 8:40-42, 49-56 සහ යොහන් 11:43, 44 කියවන්න.

අපි ආදරය කරන කෙනෙක්ගේ මරණය තාවකාලිකයි කියලා යේසුස් පෙන්නුවේ කොහොමද?

මාක් 5:42 කියවන්න.

මේ පදයට අනුව මැරුණ අයව නුදුරු අනාගතයේදී නැඟිටුවද්දී අපි අද්දකින්නේ මොකක්ද?

මරණය නිසා ඇති වෙන වේදනාව සදාකාලික එකක් නෙමෙයි කියලා දැනගන්න ලැබුණ එක ගැන ඔයා අගය කරන්නේ ඇයි?

www.jw.org © 2015 Watch Tower Bible and Tract Society of Pennsylvania

3 ඔයාගේ විශ්වාසයන් පැහැදිලි කරන්න

කවුරු හරි මෙහෙම කිව්වොත් . . .

දුක් වෙන එකෙන් පේන්නේ නැවත නැඟිටීම ගැන විශ්වාසය නැහැ කියලයි.

ඔයා මෙහෙම කියන්න ඉඩ තියෙනවා . . .

සමහර අය ඒකට එකඟ වෙන්න ඉඩ තියෙනවා. ඒත් මම විශ්වාස කරන්නේ ඊට වඩා වෙනස් දෙයක්. මොකද . . .

_____

_____

ඔයා එයාට පෙන්වන්නේ මොන බයිබල් පදයද?

_____

එයා දරන අදහස මනසේ තියාගෙන ඒ බයිබල් පදය පැහැදිලි කරන්න ඔයාට පුළුවන් කොහොමද?

_____

කවුරු හරි මෙහෙම කිව්වොත් . . .

මැරුණ අයව ආපහු කවදාවත් දකින්න ලැබෙන්නේ නැහැ.

ඔයා මෙහෙම කියන්න ඉඩ තියෙනවා . . .

අපි ආදරය කරන අය මැරුණාම ඒ අයව අපිට නැති වෙනවා තමයි. ඒත් ආපහු කවදාවත් එයාලව දකින්න ලැබෙන්නේ නැහැ කියලා මං විශ්වාස කරන්නේ නැහැ. මොකද . . .

_____

_____

ඔයා එයාට පෙන්වන්නේ මොන බයිබල් පදයද?

_____

එයා දරන අදහස මනසේ තියාගෙන ඒ බයිබල් පදය පැහැදිලි කරන්න ඔයාට පුළුවන් කොහොමද?

_____

www.jw.org © 2015 Watch Tower Bible and Tract Society of Pennsylvania